රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:19/90

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1990 මාර්තු මස 16 වනදින

අමාත්‍යාංශ ලේකම්වරුන්/ පළාත් සභ ප්‍රධාන ලේකම්වරුන්/
ආණ්ඩුකාරවරුන්ගේ ලේකම්වරුන්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන්/
දිසාපතිවරුන්/ පළාත් පාලන ප්‍රාදේශීය කොමසාරිස්වරුන්/
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්/
පළාත් පාලන සේවා කොමිෂමේ ලේකම් සහ
සංස්ථා සභාපතිවරුන් වෙත.

**<u>රාජකාරි දුරකථන පාවිච්චිය.</u>**

රාජකාරි නිවාස දුරකථන සපයා ඇති නිලධාරීන්ගේ එකී දුරකථන බිල්පත්වලින් 10% ක් අයකර ගැනීමට සහ මෙම සීමාව ඉක්මවා පෞද්ගලික ඇමතුම් ලබා ගන්නා නිලධාරීන් විසින්, ගෞරව බහුමානයෙන්" කරනු ප්‍රකාශ මත, අමතර පෞද්ගලික ඇමතුම් සඳහා මුදල් අයකර ගැනීමටත් රජය තීරණය කර ඇත.

02 මෙම තීරණය 1990.01.01 දින සිට ක්‍රියාත්මක විය යුතුය.

03 මෙම චක්‍රලේඛයේ විධිවිධාන රාජකාරි නිවාස දුරකථන සපයා ඇති, ඔබ ආයතනයේ සියළුම නිලධාරීන්ගේ අවධානයට යොමු කරන මෙන් දන්වමි.

අ/ක:(ජී.එන්.එම්. ප්‍රනාන්දු)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය

(විමල් අමරසේකර)
ආයතන අධ්‍යක්ෂ.